# ජනතාව පෙළගැස්වීම මැරුම් කන නොකර බැරි වැඩක්

පහුගිය නිදහස් දිනයේදී අලුත්ම පියවරක් ආණ්ඩුව ගත්තා. ඒ තමා නිදහස් දිනයේදීම මැර බලය යොදා ගැනීම. රාත්‍රියේ ඉටි පන්දම් එළියෙන් පෙළපාලියක් දක්වන්න බලාපොරොත්තු වෙච්චි කරූ ජයසූරිය මහත්තයාටත්, අනුගාමිකයන්ටත් පන්දම් එළියන්ම බල බලා පහර දීල තියෙනවා.

ඒ විතරක් නෙවෙයි වාහන විනාශ කරල, ඒ උදවිය පැළැඳගෙන හිටිය ඔරලෝසු, වළලු, හා මාල උදුරාගෙන. වටිනා රන් මාලම කිහිපයක් උදුරාගත්ත බවයි යූ.ඇන්.පී. ඇත්තෝ කියන්නේ.

ඊට අමතරව අවට මෝටර් වාහන ගණනාවකට පහර දීල විනාශ කරල තියෙනවා. කවුරුවත් ලොකු තුවාල ලැබුවේ නැති වුණාට, තුවාලකරුවොත් සෑහෙන්න ඉඳල.

ආණ්ඩුවේ බලපුළුවන්කාරයෝ කියන්නේ එතැන තිබුණ බෝධි පූජාවක කලබලයක් ඇති වුණා කියල. ඇත්ත තමා කරූ ජයසූරිය මහත්තයාලගේ පෙළපාලිය ගැන ආරංචි වුණ ආණ්ඩුවේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් පුංචි බොරැල්ලේ බෝධිය ළඟ පූජාවක් සූදානම් කරලා.

කොහොමටත් පුංචි බොරැල්ල යූ.ඇන්.පී.යට වැඩි බලයක් තියෙන තැනක් නෙවෙයි. මුළු කොළඹම විශාල වැඩි ඡන්දයකින් දිනුවත්, බොරැල්ල ආසනයේ දිනුම ඒ තරමට ලබාගැනීමට යූ.ඇන්.පී. යට පුළුවන් වුණේ නෑ.

ඒ කාලේ වමටත් විශාල බලයක් බොරැල්ලේ තිබුණා. විවියන් තුන්කොන් සටනකින් දිනුවා බොරැල්ලේදී. අද නම් ඒ වගේ වමේ බලයක් නෑ. වමේ හිටපු අය සමහරු ආණ්ඩුවේ. තව සමහරු යූඇන්පී. මේ අනුව ආණ්ඩුවට යම් බලයක් තියෙන තැනක්.

රාත්‍රියේ සාම පෙළපාලියක් පන්දම් එළියෙන් එවැනි තැනක කරන එක ලොකු වීර ක්‍රියාවක්. හැබැයි ගැටුමකට සූදානම් නොවී කරන එක මෝඩකමක්.

පොලීසිය වැඩ කරන්නේ ආණ්ඩුව වෙනුවෙන් කියල විරුද්ධ පක්ෂයේ කවුරුත් දන්නවා. පහුගිය දෙසැම්බර් 7 වැනිදා මගේ වෑන් රථයට පහර දීම සැලසුම් කිරීමට පොලීසියත් හවුල් බව මන් හොඳට දන්නවා.

වාහනේ රෑ වෙනකම් රඳවාගෙන හිටියේ පොලිස් බලය පාවිච්චි කරලා. ඒ අනුව රාත්‍රියේදී පහර දීමට ආණ්ඩුවේ බලවතුන් සැලසුම් කළා. එවැනි දේවල් සිදු වෙන, ඊනිවිස් එකට රාත්‍රියේදී පහර දුන් පරිසරයක රාත්‍රියේ පෙළපාලියක් දියත් කිරීම ප්‍රබල අභියෝගයක්. ඒ අනුව කරූ මහත්තයා හොඳට දැනගෙන මේ සටනට ආව කියලයි මන් හිතන්නේ.

යූ.ඇන්.පී. පෙළපාලිය එනකොට බෝධිය ළඟ පිරිසක් බෝධි පූජා පවත්වන බව පොලීසිය දැනගත්තාම පොලීසිය දෙගොල්ලොම එක තැනකට එන එක නවත්වන්න බැරියර් නම් දාල නෑ.

හැබැයි අපරාදේ කියන්න බෑ, ඒ උදවිය කරූ මහත්තයාලට කියල තියෙනවා හන්දිය හරහා යන්න ගියොත් ගැටුමක් ඇති වෙන්න පුළුවන් බව. ඒ ඇරෙන්න ගැටුම වලක්වන්න නිසි පියවර ගත්ත කියල කියන්න බෑ.

කොහොම වුණත් ගැටුමක් බලාපොරොත්තුවෙන් තැනකට යනකොට ඒක හොඳ සැලසුමක් තුළින් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ගැටුමෙන් නිකම්ම තුවාල සමඟ කැඩුම් බිඳුම් ඇති කරගැනීමෙන් ප්‍රයෝජනයක් නෑ, ඒවාට නිසි ප්‍රචාරය සමඟ සිදුවීම වාර්තා කරගන්නේ නැතිව.

කොහොමටත් වාර්තාකාරයින්ටත් පහර දෙන බවත් සැලකිල්ලට අරන් ක්‍රියා කරන්න වෙනවා. එහෙම නැතිව පොලීසිය නියම ලෙසට ක්‍රියා කරනව කියල බලාපොරොත්තු වෙන්න බෑ. ඒක එහෙම නෙවෙයි කියල කරූ ජයසූරිය මහත්තයම රටට ප්‍රකාශ කරලත් තියෙනවා.

එක අතකින් මිනීමරු ඒකාධිපති පාලනයක් කියල හඳුන්වල දෙන අතර, අනෙක් අතට පොලීසිය සාමය රකියි, පහර දෙන එකක් නෑ, ගැටුම් ඇති වෙන්නෙත් නෑ ආදී වශයෙන් හිතල වැඩ කරන්න බෑ.

ඇත්තටම අද තියෙන්නේ භයානකම තත්ත්වයක්. ආණ්ඩුව එළිපිට මර්දනයක් කරන්නේ නෑ. පොලීසිය දමල පෙළපාලි නවත්වන්නේ නෑ. මාධ්‍යයට නීතියෙන් තහංචි නෑ. හදිසි නීතිය තිබුණත් ඒ මගින් එළිපිට තහංචි නෑ. ඒ අනුව බැලූ බැල්මට මර්දනයක් නෑ.

සංචාරකයෝ ඇවිත් ඉතාම නිදහස්ව එහා මෙහා ඇවිදිනවා. ලොකුවට චෙක් පොයින්ට් තියෙන බවක් පෙනෙන්නේ නෑ. ඒ වුණත් රජයේ උදවියම ත්‍රස්තවාදී වැඩ සැලසුම් සහගතව කරනවා. ඒවා වලක්වන්න පොලීසියට තියා ත්‍රිවිධ හමුදාවටවත් බෑ. ඒක මන් හොඳට දන්නවා.

මන් එදා දෙසැම්බර් 7 වැනිදා ලංකාවට එනකොට කිසිම ප්‍රශ්නයක් නිල වශයෙන් ඇති වුණේ නෑ. කිසිම නිලධාරියෙක් මගෙන් එංගලන්තයේදී මන් කළේ මොනවද, මුණ ගැහුනේ කවුද, කින්ද මන්ද කියල වචනයක්වත් ප්‍රශ්න කළේ නෑ. හැමෝම හිනා වෙලා ඉක්මනට පාස්පෝට් බලල එළියට එව්වා.

හැබැයි එළියේ මැරයෝ ලෑස්ති කරල තිබුණා රජය විසින්ම, පහර දීමට. ඒවා වැළැක්වීමට පොලීසිය හෝ හමුදාව පියවර ගත්තේ නෑ. ඒ අය කළේ මැරයන්ට උදව් වෙන එක. වාහනවල නැගල, පිට වෙන එක නවත්තල, මැර ප්‍රහාරයට ලක් කිරීම හරියටම සූදානම් කළේ පොලීසිය.

දැන් මේ පුංචි බොරැල්ලේදීත් වැඩ සිද්ධ වුනේ ඒ ආකාරයටමයි. මේ තමා අද ලංකාවේ නීතියේ තත්ත්වය. මේ තත්ත්වය තුළ දේශපාලකයන්ට වඩා, දේශපාලනයට සම්බන්ධ නැති මාධ්‍යකරුවන්ට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙනවා.

දකුණේ මේ තත්ත්වය තියෙද්දී, දෙමළ පෙදෙස්වල තත්ත්වය මීටත් වඩා භයානකයි. එහේ පොලීසියටත් වඩා හමුදාව තමා නීතිය ක්‍රියාත්මක කරන්නේ. හැම පාරකම, හැම ඉසව්වකම හමුදාව සැරිසරනවා. ඒ අනුව නීතිය ඉහටත් උඩින් ක්‍රියාත්මකයි කියලයි පෙනෙන්නේ. ඒත් ඇත්ත තත්ත්වය ඉතාම කණගාටුදායකයි. නිරන්තරයෙන්ම සොරකම්, මැරකම් හැම තැනම සිදු වෙනවා.

මන් මේ සතියේ ගියා බාලසිංහම් සහෝදරයාගේ බිරිඳගේ අවමගුලට ගල්කිස්සේ මහින්ද මල් ශාලාවට. එදා එතන හැම කාමරයකම තිබුනේ දෙමළ මරණ. හරියටම කොළඹට හා අවට නගරවලට දෙමළ මහලු අය මරණයට එනව වගේ පෙනෙන්නේ. ඒ හැම පවුලකම දූදරුවෝ පිටරටවල්වල. වයසක අය ඒ නිසා දෙමළ නිජබිමෙන් පිට වෙලා මහ කොළඹට ඇවිත් ජීවත් වෙනවා.

දේශපාලනයට, මාධ්‍ය වැඩට යන්නේ නැත්නම් කොළඹ ඒ තරම් කරදර නෑ. ඒත් යාපනයේ වුණත් ඒහෙම නෑ. ගහක පොල් ගෙඩියක් වත් තියාගන්න බෑ. මේ තමා මළ ගෙදරට ආපු ඇත්තෝ මට කිව්ව කතන්දරය. අහලක් ගානේ හමුදාව ඉන්නවා නම් කොහෙමද මේක වෙන්නේ? එක්කෝ ආණ්ඩුවට සම්බන්ධ දේශපාලන සංවිධානවල සන්නද්ධ කට්ටිය මේවා පිටුපස ඉන්නවා. නැත්නම් හමුදාවලට සම්බන්ධ මැර කල්ලි ක්‍රියාත්මක වෙනවා.

මේ තරම් සිදුවීම් තිබියදී ඇයි වරදකරුවන් අත්අඩංගුවට ගැනීමට බැරි වෙන්නේ? මන් දැන් දන්නවා, මාව මරන්න ආපු අය ගේ නම් ගම්, ඒවා දුන්නත් අද වෙනකල් පොලීසියට ඒ ගැන ක්‍රියා කරන්න බැරි වුණා කියල.

ඒ ගැන පොලීසියටම දොස් කියන්න බෑ. ඒ අයත් රජයේ සේවයක් කරන්නේ. පොලිස් කොමිෂයමත් නෑ. ලොකුම පොලිස්කාරයා මහින්දගේ ඇබිත්තයෙක්. ඉතින් කොහොමද පොලීසියේ අය සාධාරණව ක්‍රියා කරන්නේ? ඒ අයට මාරුවීම්, වැඩ තහනම් කිරීම් ආවොත් කාට කියන්නද? ඒ නිසා පොලීසියෙන් නීතිය ක්‍රියාත්මක කිරීම බලාපොරොත්තු වෙන්න බෑ. අපටම වෙනව ආරක්ෂා සහිතව ජනතාව පෙළගැස්වීමේ වැඩේ කරගෙන යන්න. මැරුම් කන වැඩක්. ඒත් නොකරත් බෑ.